# 2012 වර්ෂය සඳහා සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම
# රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය

1. 2007 ජූලි මස 30 අංක 1508/08 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයට යටත්ව, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධිත පහත සඳහන් ආයතනයන් වෙනුවෙන් 2012 වර්ෂයට ලියාපදිංචිවීම සඳහා ඉදිකිරීම්, අළුත්වැඩියාවන් හා භාණ්ඩ සහ සේවා සැපයීම සඳහා විදේශීය නිෂ්පාදකයින් , අනුමත නියෝජිතවරුන්, දේශීය නිෂ්පාදකයින්, දේශීය සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ උපදේශක ආයතනයන් ගෙන් රාජ්‍ය ආරක්ෂක ලේකම් විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

* රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය
* ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
* ශ්‍රී ලංකා නාවික හමුදාව
* ශ්‍රී ලංකා ගුවන් හමුදාව
* ශ්‍රී ලංකා පොලීසිය
* කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
* රණ විරු සේවා අධිකාරිය
* ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය
* ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව
* වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව
* රාජ්‍ය බුද්ධි සේවය
* ජාතික ශිෂ්‍ය භට බලකාය
* විශේෂ කාර්ය බලකාය
* සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
* අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය
* පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
* ආරක්ෂක සේවා විද්‍යාලය
* වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව
* නාගරික සංවර්ධන අධිකාරිය

2. සැපයුම්කරුවෙකු ලෙස ලියාපදිංචි වීමට අපේක්ෂා කරන පුද්ගලයන්හට අදාල ඉල්ලුම්පත් රු. 500/- ක මුදලක් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී වෙත, 2011 අගෝස්තු මස 29 දින සිට සැප්තැම්බර් මස 30 දින දක්වා කාර්යාලීය වේලාවන් තුල (පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා) ගෙවීම මගින් ලබාගත හැකි අතර 2011 සැප්තැම්බර් මස 30 දිනට පසුව මොනයම් හේතුවක් නිසාවත් ලියාපදිංචි වීමට අදාල අයදුම්පත් නිකුත් කිරීම සිදු නොකෙරේ.

3. ලියාපදිංචි වීමට අදාල ඉල්ලුම්පත් කට්ටලය පිටු 60 කින් පමණ යුක්ත වන අතර එය පහත සඳහන් කොටස් වලින් සමන්විත වේ.

   1. පිටු 45 කින් පමණ යුක්ත විස්තරාත්මක කාණ්ඩ ලැයිස්තුව
   2. ප්‍රධාන ඉල්ලුම්පත් පෝර්මය
   3. විදේශීය සැපයුම් ආයතනයේ දත්ත පොරමය (ඇමුණුම 'ඒ ' )
   4. උපදෙස් හා කොන්දේසි අඩංගු පත්‍රිකාව (ඇමුණුම 'බී' , 'බී1' )
   5. මුදල් ගෙවීමේ වවුචරය.
   6. ඉල්ලුම්පත් භාරගන්නා හා කාණ්ඩ ගාස්තු ගෙවීම සිදුකල හැකි දින පිළිබඳ විස්තරය.

   විස්තරාත්මක කාණ්ඩ ලැයිස්තුවෙහි එක් එක් කාණ්ඩ යටතේ ඇති භාණ්ඩ හා සේවා පිළිබඳ විස්තර හා ඒවා සැපයිය හැක්කේ කුමන සැපයුම්කරුවන්ටද(දේශීය / විදේශීය ) යන්නත් පැහැදිළිව විස්තර කර ඇත.

4. ප්‍රධාන සැපයුම් වර්ගීකරණයන් සහ ඒ යටතේ ගැනෙන කාණ්ඩ සංඛ්‍යාව හා ඒවා සැපයිය හැක්කේ කුමන සැපයුම්කරුවන්ටද යන්න ( දේශීය හෝ විදේශීය ) පහත දැක්වේ.

| වර්ගීකරණය | සැපයුම්කරු | කාණ්ඩ සංඛ්‍යාව |
|---|---|---|
| සාමාන්‍ය ඉංජිනේරු | දේශීය හා විදේශීය | 26 |
| ලිපිද්‍රව්‍ය | දේශීය හා විදේශීය | 7 |
| කාර්යාලීය යන්ත්‍රෝපකරණ සහ අනෙකුත් උපකරණ | දේශීය හා විදේශීය | 18 |
| කොඩි කුඩාරම් නිල ඇඳුම් රෙදි පිළි ට්‍රැෆික් උපකරණ | දේශීය හා විදේශීය | 16 |
| ඉදිකිරීම් ද්‍රව්‍ය හා ගොඩනැගිලි ද්‍රව්‍ය | දේශීය | 30 |
| මෝටර් රථ වාහන | දේශීය හා විදේශීය | 21 |
| වෛද්‍ය උපකරණ | දේශීය හා විදේශීය | 10 |
| විශේෂිත වූ හමුදා ආරක්ෂිත උපකරණ ගිනි නිවාරණ උපකරණ සහ කිමිදුම් භාණ්ඩ සහ ඇඳුම් කට්ටල | දේශීය හා විදේශීය | 12 |
| කම්බි සහ කේබල් ඇතුළු සියලුම විදුලි උපකරණ සහ උපාංග | දේශීය | 18 |
| සන්නිවේදන / විද්‍යුත් උපකරණ | දේශීය හා විදේශීය | 74 |
| ගෘහ භාණ්ඩ | දේශීය හා විදේශීය | 6 |
| අවි ආයුධ උපකරණ | දේශීය හා විදේශීය | 24 |
| ක්‍රීඩා උපකරණ | දේශීය | 1 |
| සංගීත සහ සංගීත කණ්ඩායම් උපකරණ | දේශීය හා විදේශීය | 3 |
| ගෘහස්ත සූප සහ මුළුතැන්ගෙයි උපකරණ | දේශීය හා විදේශීය | 3 |
| යන්ත්‍ර සූත්‍ර යන්ත්‍රෝපකරණ සහ අමතර කොටස් | දේශීය හා විදේශීය | 43 |
| අශ්ව සහ සුනඛයින් සහ ඊට අදාල අනෙකුත් දෑ | විදේශීය | 6 |
| ආහාර වර්ග | දේශීය හා විදේශීය | 29 |
| අළුත්වැඩියාවන් , සවිකිරීම් සහ සේවා කටයුතු | දේශීය හා විදේශීය | 188 |
| ගුවන් යානා එන්ජින් සහ අනෙකුත් දෑ | විදේශීය | 20 |
| ගුවන් යානා ප්‍රොපලර් / රොටර් බ්ලේඩ් සඳහා අමතර කොටස් | විදේශීය | 13 |
| ගුවන් යානා හයිඩ්‍රොලික් සහ නියුමැටික් අමතර කොටස් | විදේශීය | 19 |

| | | |
|---|---|---|
| ගුවන් යානා ලැන්ඩිං පියවර සහ ඊට අදාල අමතර කොටස් | විදේශීය | 20 |
| ටයර් හා ටියුබ් අමතර කොටස් සහ උපාංග | විදේශීය | 19 |
| ගුවන් යානා වීල් හා බ්රේක් සඳහා අමතර කොටස් | විදේශීය | 20 |
| ගුවන් යානා විදුලිමය කොටස් සඳහා අවශ්‍ය අමතර කොටස් | විදේශීය | 20 |
| ගුවන් යානා ඔටෝ පයිලට් පැකේජ් සඳහා අමතර කොටස් | විදේශීය | 11 |
| ගුවන් යානා බැටරි සහ අමතර කොටස් | විදේශීය | 20 |
| ගුවන් යානා සාමාන්‍ය සැකිලි සහ අමතර කොටස් | විදේශීය | 20 |
| ගුවන් යානා සැකිලි කොටස් / සැකිලි | විදේශීය | 20 |
| ගුවන් යානා සැකිලි සාමාන්‍ය ඉදිකිරීම් ද්‍රව්‍ය හා අමතර කොටස් | විදේශීය | 08 |
| ගුවන් යානා ගිනි නිවාරණ බෝතල් සහ කාර්ට්‍රිජස් | විදේශීය | 19 |
| ගුවන් යානා සාමාන්‍ය ආම්පන්න සහ පරීක්ෂණ උපකරණ | විදේශීය | 04 |
| ගුවන් යානා නඩත්තු සඳහා විශේෂිත ආම්පන්න | විදේශීය | 20 |
| ගුවන් යානා එන්.ඩී.ටී. කොටස් අමතර කොටස් සහ ද්‍රව්‍යයන් | විදේශීය | 05 |
| ගුවන් යානා ඒරියල් ඩිලිවරි පද්ධති ද්‍රව්‍යයන් සහ අමතර කොටස් | විදේශීය | 07 |
| ගුවන් යානා කන්සියුමබල් ද්‍රව්‍යයන් | විදේශීය | 08 |
| ගුවන් යානා ආශ්‍රිත ආරක්ෂක උපකරණ | විදේශීය | 08 |
| පැරා ජම්පින් උපකරණ සහ උපාංග | විදේශීය | 06 |
| ගුවන් යානා ඒවියොනික් උපකරණ / අමතර කොටස් | විදේශීය | 20 |
| ශ්‍රී.ල.ගු.හමුදාවේ ඒවියොනික්ස් උපකරණ අමතර කොටස් | විදේශීය | 21 |
| එයාර් පීල්ඩ් ගොඩනැගීමේ උපකරණ | විදේශීය | 06 |
| ගුවන් යානා එන්ජින් අමතර කොටස් නඩත්තුව, ප්‍රතිසංස්කරණය සහ කොටස් මාරුව | විදේශීය | 19 |
| ගුවන් යානා සැකිලි නඩත්තුව, ප්‍රතිසංස්කරණය සහ කොටස් මාරුව | විදේශීය | 20 |
| හයිඩ්‍රොලික් හා නියුමැටික් උපකරණ නඩත්තුව, ප්‍රතිසංස්කරණය සහ කොටස් මාරුව | විදේශීය | 20 |
| ලැන්ඩින් ගියර් උපකරණ නඩත්තුව, ප්‍රතිසංස්කරණය සහ කොටස් මාරුව | විදේශීය | 20 |
| විදුලි කොටස් හා උපකරණ නඩත්තුව, ප්‍රතිසංස්කරණය සහ කොටස් මාරුව | විදේශීය | 20 |
| ගිනි නිවාරණ බෝතල් නඩත්තුව, ප්‍රතිසංස්කරණය සහ කොටස් මාරුව | විදේශීය | 20 |
| ගුවන් යානා ව්‍යුහමය අලුත්වැඩියාවන් ප්‍රතිසංස්කරණයන් කොටස් මාරුව | විදේශීය | 20 |
| ගුවන් යානා ආරක්ෂිත උපකරණ අලුත්වැඩියාවන් ප්‍රතිසංස්කරණයන් කොටස් මාරුව | විදේශීය | 01 |
| ගුවන් යානා ටයර් රිටේඩ්‍රිං | විදේශීය | 17 |
| ගුවන් යානා එන්.ඩී.ටී. උපකරණ අළුත්වැඩියාව | විදේශීය | 01 |
| ගුවන් යානා සර්වේ ඇකියුරේටස් අළුත්වැඩියාවන් පූර්ණ අළුත්වැඩියාව සහ කොටස් මාරුව | විදේශීය | 01 |
| ගුවන් යානා හනිකොම්බ් පැනල් අළුත්වැඩියාව - බෙල් 206/212/412/412 ඊපි හෙලිකොප්ටර | විදේශීය | 01 |
| ගුවන් යානා ඉන්ජෙක්ටර් නල සහ ලිහිසි ශීතකරණයන් අළුත්වැඩියාවන් පූර්ණ අළුත්වැඩියාව සහ කොටස් මාරුව- බෙල් 206/212/412/412 ඊපි හෙලිකොප්ටර | විදේශීය | 01 |
| ගුවන් යානා ෆික්ස් රොටරි වින්ග් හා අමතර කොටස් | විදේශීය | 09 |
| විශේෂිත ඒවියොනික්ස් උපකරණ නඩත්තුව, ප්‍රතිසංස්කරණය සහ කොටස් මාරුව | විදේශීය | 01 |
| ඒවියොනික් උපාංග ආකෘති අළුත්වැඩියාවන් ප්‍රතිසංස්කරණයන් කොටස් මාරුව | විදේශීය | 24 |
| නාවික යාත්‍රා එන්ජින් | විදේශීය හා දේශීය | 06 |
| නාවික යාත්‍රා එන්ජින් අමතර කොටස් | විදේශීය හා දේශීය | 06 |
| නාවික ජෙනරේටර් සහ අමතර කොටස් | විදේශීය හා දේශීය | 06 |
| නාවික ඕ.බී.එම්. සඳහා එන්ජින් සහ අමතර කොටස් | විදේශීය හා දේශීය | 03 |
| විවිධ | විදේශීය හා දේශීය | 41 |
| ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා විශේෂ සේවා | විදේශීය හා දේශීය | 14 |
| සැපයුම්කරුවන්ගේ ප්‍රාදේශීය ලැයිස්තුව | | |
| පලාත් කාර්යාල සහ හමුදා කඳවුරු සඳහා දේශීය අමුද්‍රව්‍ය | දේශීය | 15 |

5. 1982 අංක 17 දරණ සමාගම් පනතේ අංක 103 වගන්තිය යටතේ වෙළඳ ආයතන ලියාපදිංචි කිරීමේ ආඥාපනත සහ අදාල විදේශීය රටවල් හි ඒ හා සමාන ආඥාපනත් වලට අනුකූල පරිදි 2011 ජනවාරි 1 දින හෝ ඊට පෙර ලියාපදිංචි වී නොමැති ආයතන මේ සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් නොලබයි. සැපයුම්කරුවන් අදාල ලියාපදිංචි සහතිකයේ සත්‍ය පිටපතක් **ප්‍රසිද්ධ නොතාරිස්වරයකු** ලවා හෝ නීතිඥයකු ලවා සහතික කර අදාල ඉල්ලුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

6. පළාත් මට්ටමින් භාණ්ඩ හා සේවා සැපයිය හැකි ප්‍රාදේශීය සැපයුම්කරුවන් ගේ නාමලේඛණයක් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය විසින් වෙනමම පවත්වා ගෙන යනු ඇත. ඒ සඳහා විස්තරාත්මක කාණ්ඩ වෙන් කොට ඇති අතර ඉල්ලුම්කරුවන් අනිවාර්යයෙන්ම අදාල පලාතේ තම වෙළඳ ආයතනය ලියාපදිංචි කර තිබිය යුතුය. භාණ්ඩ හා සේවා සැපයීමට අපේක්ෂිත පලාත අයදුම්පත්‍රයේ අදාල ස්ථානයේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

7. රුපියල් දස ලක්ෂ පහකට වැඩි සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් වැඩ සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කරන කොන්ත්‍රාත්කරුවන් නිර්මාණ අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ (අයිසීටීඒඩී) සහ ශ්‍රී ලංකා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ සංගමයේ සාමාජිකත්වය (එන්සීසීඒඑස්එල්) 2011/2012 වර්ෂය සඳහා ලබා ගෙන තිබිය යුතුය.

8. දැනට 2011 වර්ෂය සඳහා පවත්වා ගෙන යනු ලබන සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ගේ ලියා පදිංචි ලේඛණය 2011 දෙසැම්බර් මස 31 දින සිට අවලංගු වූ ලෙස සලකනු ලැබේ.

9. ලියාපදිංචි වීමට අවශ්‍ය එක් එක් කාණ්ඩයන් සඳහා රුපියල් 1000/- ගාස්තුවක් අයදුම්කරුගෙන් අයකරනු ලබන අතර, යම් දේශීය නියෝජිතයකු එක් විදේශීය සැපයුම්කරුවකුට වඩා වැඩි පිරිසකගේ නියෝජිතයා ලෙස ලියාපදිංචි වන්නේ නම් එම එක් එක් විදේශීය සැපයුම්කරු වෙනුවෙන් වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. අදාල ගාස්තුව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී වෙත ගෙවිය යුතු අතර කුවිතාන්සියේ මුල් පිටපත ඉල්ලුම්පත්‍රය සමග අමුණා තිබිය යුතුය. චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර කාණ්ඩ ගාස්තු 2011 ක්වූ අගෝස්තු මස 29 වන දින සිට ඔක්තෝබර් මස 14 වන දින දක්වා කාර්යාලයීය වේලාවන් (පෙ.ව. 09.00 සිට ප.ව. 3.00 ) තුළදී ගෙවා නිම කළ යුතුය. කිසිම හේතුවක් නිසාවත් එදිනට පසුව කාණ්ඩ ගාස්තු භාර ගැනීම සිදු කරනු නොලැබේ.

10. නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2011 ක්වූ නොවැම්බර් මස 11 දින හෝ ඊට පෙර ලැබෙන සේ කොළඹ 03, බාලදක්ෂ මාවතේ අංක 15/5 රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දේශීය සැපයුම්කරුවන් විසින් ඉල්ලුම්පත්‍ර බහාලන ලද ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ 2012 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම (දේශීය) යනුවෙන්ද, විදේශීය සැපයුම්කරුවන් විසින් 2012 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම (විදේශීය) වශයෙන්ද සඳහන් කළ යුතු අතර ඉල්ලුම්පත් අතින් භාරගැනීම සිදු නොකෙරේ. තැපෑලෙදී සිදුවන ප්‍රමාදයන් පිළිබඳවද රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය විසින් වගකියනු නොලැබේ.

11. විදේශීය සැපයුම්කරුවන් නියෝජනය කරන දේශීය නියෝජිත ආයතන ලියාපදිංචිය ලබා ගැනීම සඳහා මෙකී ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු අතර , එම දේශීය නියෝජිතයින් විසින් ඔවුන්ගේ ප්‍රධාන සැපයුම්කරුවන්ගෙන් ලබා ගන්නා ලද නියෝජිතයින් වශයෙන් පත් කිරීමේ ඇටෝර්නි බලපත්‍රය නීතිඥයකු හෝ නොතාරිස්වරයකු ඉදිරියේ සහතික කර ඉදිරිපත් කළ යුතුය. බලපත්‍රයේ වලංගු කාලය 2012.01.01 සිට 2012.12.31 දින දක්වා විය යුතු අතර මෙම බලපත්‍රයේ මුල් පිටපත අදාල ඉල්ලුම්පත්‍රය සමඟ අමුණා ඉදිරිපත් කළ යුතුය. ඇටෝර්නි බලපත්‍රය තම ප්‍රධාන සැපයුම්කාර විදේශීය ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියාගේ අත්සන සහිත විය යුතුය. විදේශීය සැපයුම්කරුවන් තම ආයතනය අදාළ රටෙහි ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ලියාපදිංචි කිරීමෙන් ලබා ගන්නා ලද සහතිකයේ පිටපතක් සත්‍ය පිටපතක් ලෙස ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ නීතිඥයකු ලවා සහතික කිරීමෙන් අනතුරුව අයදුම්පතට අමුණා තිබිය යුතුය.

12. ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරන සෑම ආයතනයක්ම පහත සඳහන් නෛතික ලේඛණ වල සහතික කරන ලද පිටපත් (අනෙකුත් ලියකියවිලි සමග) අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය.

අ. සීමිත සමාගම් - සාංගමික සංස්ථා පත්‍රය.

ආ. අනෙකුත් ආයතන - ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය.

ඉහත ලියකියවිලි වල සඳහන් ව්‍යාපාර කටයුතු හැර වෙන කිසිදු කටයුත්තක් සඳහා ලියාපදිංචි වීමට ඉල්ලුම් නොකළ යුතු අතර එවැනි ඉල්ලීම් පිළිගනු නොලැබේ.

13. විදේශීය සැපයුම්කරුවන්හට ලියාපදිංචිවීම සඳහා අදාළ ඉල්ලුම්පත් ඇමරිකානු ඩොලර් 7.5 ක් ගෙවා ශ්‍රී ලංකා තානාපති කාර්යාල වලින් ලබාගත හැකිය. එක් කාණ්ඩයක් යටතේ ලියපදිංචි වීම සඳහා ඇමරිකානු ඩොලර් 15 ක් ගෙවිය යුතු අතර තානාපති කාර්යාල වලින් නිකුත් කරන ලද කාණ්ඩ සඳහා මුදල් ගෙවන ලද කුවිතාන්සියේ මුල් පිටපත ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

14. සීමිත මිල ගණන් කැඳවීම කරනු ලබනුයේ ලියාපදිංචි සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ගේ ලේඛනය පදනම් කරගෙනය. කෙසේ වුවද අවශ්‍ය අවස්ථාවලදී පිළියෙල කරනු ලබන කෙටි ලැයිස්තුවකින් හෝ වෙනත් සැපයුම්කරුවන්ගෙන් මිලගණන් කැඳවීමේ අයිතිය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය සතුව ඇත.

15. ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත් විශේෂිත පරීක්ෂණ මණ්ඩලයක් වෙත යොමු කෙරෙන අතර අදාල සුදුසුකම් සපුරා නොමැති සහ ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ලියාපදිංචි කිරීමෙන් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

16. මිල ගණන් කැඳවන අවස්ථාවලදී මිල ගණන් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ඇනවුම් භාරදුන් පසු ඒ අනුව සැපයුම් කිරීමට අපොහොසත් වන හෝ සාම්පල ඉදිරිපත් කරන ලෙසට උපදෙස් දුන් අවස්ථාවලදී එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ඉදිරිපත් කරනු ලබන සාම්පල වලට වෙනස් භාණ්ඩ හා පිරිවිතරයනට නොගැලපෙන භාණ්ඩ සපයන සැපයුම් කරුවන් කිසිදු දැනුම් දීමකින් තොරව ලියාපදිංචි ලේඛනයෙන් ඉවත්කිරීමට කටයුතු කරනු ලැබේ.

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී
ලේකම්
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය

2011 ක්වූ අගෝස්තු මස 22 දින
කොළඹ 03 , බාලදක්ෂ මාවතේ අංක 15/5 හි
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ දීය. ච/

Annex “B1”

# 2012 වර්ෂය සඳහා සැපයුම්කරුවන් - කොන්ත්‍රාත් කරුවන් ලියාපදිංචි කිරීම සඳහා පොදු උපදෙස්, නියමයන් හා කොන්දේසි

## අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා පොදු උපදෙස් :-

1. 2012 වර්ෂය සඳහා සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි වීම සඳහා අයදුම් පත් කොළඹ 03, බාලදක්ෂ මාවත අංක 15/5 දරණ ස්ථානයේ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ හෝ අදාල රටෙහි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාල මගින් ලබාගත හැකිය. පිටපත් කරන ලද හෝ ඡායාස්ථ අයදුම්පත් පිළිගනු නොලැබේ. ( විදේශයන්හි පවත්නා ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාල මගින් නිකුත් කරන ලදුව නිසි පරිදි සත්‍ය බවට තහවුරු කරන ලද ඡායාස්ථ පිටපත් සඳහා මෙම කොන්දේසිය අදාල නොවේ.)

2. සැමවිටම නිවැරදි තොරතුරු පමණක් සපයන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. සපයා ඇති කවර හෝ තොරතුරක් සාවද්‍ය බවට හෝ කවර හෝ වැදගත් තොරතුරක් ලබාදීමෙන් වැලකී සිටින බවට පෙනී යන්නේ නම් එවැනි අයදුම්කරුවෙකු ලියාපදිංචිවීම සඳහා සුදුසුකම් නොලබනු ඇත. අසම්පූර්ණ හෝ අපැහැදිලි අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. අයදුම්පතට ආධාරක ලිපි ලේඛන ඇමිණී යුතු අතර සියලු ලිපි ලේඛන අනුක්‍රමිකව අංකනය කළ යුතුය. මුළු පිටු සංඛ්‍යාව ප්‍රධාන අයදුම්පතෙහි දකුණු පස ඉහළ කෙළවරෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය.

3.1 අයදුම්පත සමග අමුණා එවිය යුතු ආධාරක ලිපි ලේඛන පහත සඳහන් පරිදිය.

- නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සත්‍ය බවට සහතික කරන ලද ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක්.
- අදාල රටෙහි සමාගම් රෙජිස්ට්‍රාර් විසින් අදාල රටෙහි නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස් වරයෙකු විසින් සත්‍ය බවට සහතික කරන ලදුව ප්‍රධානියා වෙත නිකුත් කරන ලද සම්මුති සහතිකයක්.
- විදේශ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම දේශීය නියෝජිතයන් මගින් සිදු කිරීමේදී ප්‍රධාන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විසින් අත්සන් කරන ලදුව අදාල රටෙහි නීතිඥවරයෙකු විසින් හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සත්‍ය බවට සහතික කරන ලද ඇටෝර්නි බලයෙහි මුල් පිටපත ඉදිරිපත් කළ යුතුය. මෙම ඇටෝර්නි බලයෙහි වලංගු කාලසීමාව පැහැදිලිව සඳහන් කළ යුතු අතර ඒ කාල සීමාවට 2012.01.01 දින සිට 2012.12.31 දින දක්වා කාල පරිච්ඡේදය ඇතුළත් විය යුතුය. ෆැක්ස් , ටෙලෙක්ස් හෝ වෙනත් ක්‍රමවේද යටතේ එවනු ලබන ඇටෝර්නි බලපත්‍ර පිළිගනු නොලැබේ.
- සැපයුම්කරු හෝ ඔහුගේ ප්‍රධානියා නිෂ්පාදකයා නොවන අවස්ථාවේදී සැපයුම්කරු හෝ ඔහුගේ ප්‍රධානියා බලයලත්, ගනුදෙනුකරු හෝ බෙදාහරින්නා වන බවට නිෂ්පාදකයා විසින් ලිඛිතව සහතික කළ යුතුය.
- ඉදිරිපත් කරනු ලබන වැටිබදු අංකය අමාත්‍යාංශය විසින් පත්කරන ලද විශේෂ මණ්ඩලයක් මගින් පරීක්ෂා කරනු ලබන අතර සාවද්‍ය වැට් අංක ලබා දී ඇති සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය කිසිම දැනුම්දීමක් නොමැතිව අවලංගු කරනු ලැබේ.

3.2 අයදුම්පතක් නොමැතිව ඉදිරිපත් කරනු ලබන ආධාරක ලිපිලේඛන ප්‍රතික්ෂේප කරනු ඇත.

4. ලියාපදිංචිවීමට අපේක්ෂා කරන ව්‍යාපාර ආයතන අයදුම්පත සමග පහත සඳහන් නෛතික ලිපිලේඛණ වල සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(අ) සීමිත වගකීම් සහිත සමාගම් - සංගමික සංස්ථාපත්‍රය
(ආ) වෙනත් ආයතන - ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය

**ලියාපදිංචි කිරීමේදී ඉහත සඳහන් සහතිකවල සඳහන් ව්‍යාපාර කටයුතු හැරුණු කොට වෙනත් ව්‍යාපාර කටයුතු කෙරෙහි සැලකිල්ලක් දක්වනු නොලැබේ.**

5. සනාථකළ යුතු මූල්‍ය ස්ථාවරත්වය

- බැංකු ගිණුම ආරම්භ කරන ලද දින සිට අයදුම්කරු විසින් ජංගම ගිණුම පවත්වාගෙන යන බව සහ බැංකුකරුවන්ගේ නිර්දේශය

6. ප්‍රශ්නයක් ඉදිරියෙහි ඊට උචිත ආකාරයට “ ඔව් / නැත ” යන්න, පැහැර හැරීමකින් තොරව කපා දමන්න.

7. කරුණාකර අයදුම්කරුට අදාල නොවන කවර හෝ අයිතමයක් ඉදිරියෙන් “අදාල නොවේ” යන්න සඳහන් කරන්න.

8. විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අවශ්‍ය සියළු ලිපි ලේඛන ද සහිතව පහත සඳහන් ලිපිනයට ලැබෙන පරිදි 2011 නොවැම්බර් 11 දිනට පෙර ලියාපදිංචි තැපැල මගින් එවිය යුතුය.

ප්‍රධාන ගණකාධිකාරී
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය
15/5, බාලදක්ෂ මාවත,
කොළඹ 03

දේශීය සැපයුම්කරුවන්ට අදාලව අයදුම්පත බහාලූ ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ "සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2012 (දේශීය) " යනුවෙන් සඳහන් කළ යුතු අතර විදේශ සැපයුම්කරුවන් හෝ ඔවුන්ගේ දේශීය නියෝජිතයින් "සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2012 (විදේශීය) " යනුවෙන් සඳහන් කළ යුතු ය. අතින් භාරදෙනු ලබන අයදුම්පත් පිළිනොගන්නා අතර තැපැලේදී සිදුවන ප්‍රමාදයකට ආරක්ෂක අමාත්‍යාංශයේ කිසිදු වගකීමක් නො මැත.

අයදුම්කරුවන් සඳහා පොදු උපදෙස්

9. එක් එක් කාණ්ඩය සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් රු. 1000/- ක් (රුපියල් එක් දහසක්) ගාස්තුවක් අය කෙරෙන අතර විදේශ අයදුම්කරුවන්ගෙන් මේ සඳහා අයකෙරෙන ගාස්තුව ඇමරිකානු ඩොලර් 15 ක් වනු ඇත. දේශීය අයදුම්කරුවකු (බොහෝ විට දේශීය නියෝජිතයකු) එක් ප්‍රධාන ආයතනයකට වැඩියෙන් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්කරන්නේ නම් එබඳු එක් එක් ප්‍රධානියා වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. දේශීය අයදුම්කරුවන් විසින් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී වෙත මුදලින් ගෙවිය යුතු අතර එම ගාස්තු ගෙවීමේ දී අයදුම්පතට අමුණා ඇති ගෙවීම් වවුචරය ගොනු කර ලබාගත් ලදුපත (මුල් පිටපත) අයදුම්පතට ඇමිණිය යුතුය. (චෙක්පත් සහ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ) අයදුම්පතේ සඳහන් අංකයට සමාන අංකයක් ගෙවීම් වවුචරපතේ ද සඳහන් විය යුතු බව කරුණාකර සලකන්න. සැපයුම්කරු ලියාපදිංචි කිරීමෙන් පසුව මෙම අංකය ඔහුගේ සංකේත අංකය වශයෙන් භාවිත කෙරේ.

10. ලියාපදිංචි කිරීමෙන් පසුව යම් සමාගමක (දේශීය හෝ විදේශීය) තැපැල් ලිපිනයෙහි යම් සංශෝධනයක් හෝ වෙනසක් සිදු වුවහොත්, එම ඉල්ලීම සලකා බලනු ලබනුයේ එම ඉල්ලීම සමග එකී සංශෝධනයට සම්බන්ධ අදාල සමාගම (දේශීය හෝ විදේශිය) මගින් නිකුත් කරන ලද සංශෝධිත සහතිකයෙහි සත්‍ය පිටපතක් ඉදිරිපත් කිරීමෙන් පමණී.

11. අයදුම්කරුගේ යම් ප්‍රමාදදෝෂයක් හෝ අනවධානය සම්බන්ධයෙන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වගකීම භාරගනු නොලැබේ.

12. 2012 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාළ අවශ්‍ය සියළු තොරතුරු මෙම උපදෙස්වල , පුවත්පත් දැන්වීම් සහ අයදුම්පත්‍රයේ දක්වා ඇත. මෙම උපදෙස් ඉතා ප්‍රවේශමෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. එසේ වුවද වැඩිදුර තොරතුරු අවශ්‍ය වුවහොත් පහත සඳහන් නිලධාරීන් අ මතන්න.

ගණකාධිකාරී (සැපයීම්)

දුරකථන අංක - 001 2447459 , 011 3030736 හෝ 011 2430860 / 79 - 323 දිගුව
(කාර්යාල වේලාවන් තුළ පමණී)

ඊ-මේල් - supply@defence.lk

13. රජයේ ප්‍රසම්පාදන උපදෙස් 2006 (භාණ්ඩ සහ වැඩ) මත අංක 8.11.5 ඇ දරණ වගන්තියේ උපදෙස් ප්‍රකාරව කොන්දේසි පැහැර හැරි කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවෙහි නම් සඳහන් සැපයුම්කරුවන්ට ලියාපදිංචි වීම සඳහා අවසර නොලැබේ

14. මිල ගණන් ඉදිරිපත් කළ පසු සැපයීම සඳහා අවශ්‍ය පරිදි තොග තබා ගැනීම සැපයුම්කරු විසින් කළ යුතු අතර, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වන අවස්ථාවේදී එක් මසක ණය පහසුකම් සැපයීමට සියළු සැපයුම්කරුවන් ස්වයංක්‍රීයවම එකඟ වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

15. සාමාන්‍යයෙන් ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන් සීමිත මිල ගණන් කැඳවනු ලැබේ. එසේවුවද අවශ්‍ය අවස්ථාවන්හිදී සැපයුම්කරුවන් තෝරා ගැනීමේ සම්පූර්ණ අයිතිය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය සතුවේ.

16. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් සියළු අයදුම්පත් සලකා බලන අතර, අවශ්‍ය සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් පමණක් ලියා පදිංචි කෙරේ. අවශ්‍ය සුදුසුකම් සතුටුදායක ලෙස සම්පූර්ණ කොට නොමැති සහ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

17. මිල ගණන් ඉල්ලා සිටි අවස්ථාවක වාර හතරක් තුළ මිලගණන් ඉදිරිපත් කිරීමට හා මිල ගණන් ලබා දීමට නො හැකිබව ("No Quote") දැක්වීමට අපොහොසත් වන හෝ ඇණවුමක් නියමිත වේලාවටම ක්‍රියාත්මක කළ නොහැකි හෝ ඉල්ලා සිටි අවස්ථාවක නියැදි ඉදිරිපත්කිරීමට අපොහොසත් වන හෝ සැපයුම් පිරිවිතරයන්ට අනුකූල නොවන හෝ අනු මත නියැදියට වෙනස් සැපයුම් ඉදිරිපත් කරන හෝ සැපයුම්කරුගේ ලියාපදිංචිය දැනුම්දීමකින් තොරව අවලංගු කරනු ඇත.

18. අදාළ කාණ්ඩ සඳහා ගාස්තු ගෙවා එහෙත් ලියාපදිංචි නොවන කවරෙකු හෝ වෙතොත් එම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

**19. ලියා පදිංචි කිරීමෙන් පසුව කවර කරුණක් යටතේ හෝ කාණ්ඩ වර්ගයෙහි කිසිඳු වෙනසක් සිදු කළ නොහැකි බව හා කාණ්ඩ අතර මාරුකිරීම් ද සිදුනොකරන බව සළකන්න.**

* සියලු සහතික මුල්පිටපත් මගින් සැපයිය යුතුය ඡායාස්ථ පිටපත් භාරගනු ලබනුයේ ප්‍රධාන නියෝජිතයාගේ රටේ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු විසින් ඒවා සහතික කොට ඇත්නම් පමණි.

බී.ඩබ්ලිව්. මෙන්ඩිස්
ගණකාධිකාරී (සැපයීම්)

අත්. කළේ ගෝඨාභය රාජපක්ෂ RWP, RSP, Psc
ලේකම්
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය

ච/

# සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2012 වර්ෂය

1. අයදුම්පත් නිකුත් කිරීම 2011.08.29 - 2011.09.30
(පෙ.ව. 9.00 - ප.ව. 3.00)

2. කාණ්ඩ ගාස්තු භාරගැනීම 2011.08.29 - 2011.10.14
(පෙ.ව. 9.00 - ප.ව. 3.00)

3. සම්පූර්ණ කරනලද අයදුම්පත් 2011.11.11 දිනට පෙර , ප්‍රධාන ගණකාධිකාරී, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය, 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03. යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් පමණක් එවිය යුතුය.